**ලංකා බැංකුව - 2013**
**---------------------**

2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශන, විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන හා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත ලංකා බැංකුවේ (බැංකුව) මූල්‍ය ප්‍රකාශන සහ බැංකුව හා එහි පරිපාලිතයන්ගේ (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලී වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය. පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිතයන්හි සාමාජිකයන් විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරි සමාගම් විසින් විගණනය කරන ලදී.
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවට අනුව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1.2 බැංකුව සඳහා විශේෂ ව්‍යවස්ථාපිත විධිවිධාන
---------------------------------------------------

1971 අංක 38 දරන මුදල් පනතේ 5(1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව, 1992 මැයි 14 දිනැති අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයෙහි පළකරන ලද එවකට මුදල් අමාත්‍යවරයාගේ නියෝගය පරිදි එකී මුදල් පනතේ 11 කොටසෙහි ඇතුළත් විධිවිධානවලින් බැංකුව නිදහස් කර ඇත. එසේම අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදුව, භාණ්ඩාගාර ලේකම් විසින් ඔහුගේ 1992 අප්‍රේල් 10 දිනැති අංක ඊඒ02/බීසී/බීපී/01 දරන චක්‍රලේඛය මගින් දන්වන ලද පරිදි සියළු භාණ්ඩාගාර හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලින් බැංකුව නිදහස් කර ඇත.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.4 විගණන විෂය පථය හා මතය සඳහා පදනම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම් විගණනයට ඇතුළත් වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍යවන සියළුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 මතය**

---

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුව නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

බැංකුවේ කොටස් හිමියන් සම්බන්ධයෙන් බලන කල බැංකුවේ හා එහි පරිපාලිතයන්ගේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 සමූහයේ මූල්‍ය ප්‍රකාශන හා ඒකාබද්ධ කිරීමේ පදනම**

---

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන දේශීය බැංකු ඒකකය, විදේශීය බැංකු ඒකකය, ඉස්ලාමීය බැංකු ඒකකය හා බැංකුවේ කොටසක් වන විදේශීය මෙහෙයුම්වල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධවීමෙන් සමන්විත වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර) අනුකූලව බැංකුවේ, එහි පරිපාලිත සමාගම්වල හා ආශ්‍රිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධවීමෙන් සමූහ මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ.

එක් එක් සමාගමේ 2013 දෙසැම්බර් 31 දිනට හා ඉකුත් වර්ෂය අවසානයට බැංකුවේ ආයෝජනවල තත්ත්වය පහත පරිදි විය.

| **සමාගමේ නම** | **ආයෝජනය** | |
|---|---|---|
| | **2013** | **2012** |
| | **රු.මිලියන** | **රු. මිලියන** |
| **පරිපාලිත සමාගම්** | | |
| **මිල ප්‍රකාශිත** | | |
| ප්‍රොපටි ඩිවලොප්මන්ට් පීඑල්සී | 776 | 740 |
| ශ්‍රී ලංකා මර්චන්ට් බැන්ක් පීඑල්සී | 2,123 | 2,123 |
| **මිල ප්‍රකාශිත නොවන** | | |
| සීමාසහිත බීඕසී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝට් සර්විසස් (පුද්ගලික) සමාගම | 1 | 1 |
| සීමාසහිත බීඕසී ප්‍රොපටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම | 1,010 | 1,010 |
| සීමාසහිත බීඕසී ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම | 2 | 2 |
| සීමාසහිත හොටෙල්ස් කළම්බු (1963) සමාගම | 101 | 101 |
| සීමාසහිත මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා සමාගම | 132 | 22 |
| සීමාසහිත සීලිස් ෆයිනැන්ෂල් සර්විසස් සමාගම | - | 110 |
| සීමාසහිත ලංකා බැංකුව (යුකේ) සමාගම | 2,684 | 2,684 |
| **පරිපාලිත සමාගම්වල මුළු ආයෝජන** | **6,829** | **6,793** |
| **ආශ්‍රිත සමාගම්** | | |
| **මිල ප්‍රකාශිත නොවන** | | |
| සීමාසහිත ට්‍රාන්ස් නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලියුෂන්ස් (පුද්ගලික) සමාගම | 20 | 20 |
| සීමාසහිත සී බැන්ක් ඇසෙට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම | 31 | 31 |
| සීමාසහිත සදර්න් ඩිවොලප්මන්ට් ෆයිනැන්ෂල් සමාගම | 25 | 25 |
| සීමාසහිත මිරේකා කැපිටල් ලැන්ඩ් (පුද්ගලික) සමාගම | 750 | 750 |
| සීමාසහිත ලංකා සිකියුරිටිස් (පුද්ගලික) සමාගම | 42 | 42 |
| **ආශ්‍රිත සමාගම්වල මුළු ආයෝජන** | **868** | **868** |
| අඩුකළා - හානිකරණය සඳහා ප්‍රතිපාදන | (25) | (25) |
| **ආශ්‍රිත සමාගම්වල ශුද්ධ ආයෝජන** | **843** | **843** |
| **මුළු ආයෝජන** | **7,672** | **7,636** |

### 2.2.2 බැංකුව සමඟ අධ්‍යක්ෂවරුන්ගේ කොන්ත්‍රාත් බැඳීම

-----------------------------------------------------

ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 55 හි හෙළිදරව් කිරීම් හැර කිසිදු අධ්‍යක්ෂවරයෙකු බැංකුව සමඟ සෘජුවම හෝ වක්‍රව කිසිදු කොන්ත්‍රාත් බැඳීමක් ඇති කර ගෙන නොතිබුණි.

**2.3 බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

---

**2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රීලංගිප්‍ර)**

---

"මිණුම් කිරීමේ පදනම මඟින් මූල්‍ය උපකරණ විශ්ලේෂණය " හෙළිදරව් කිරීම යටතේ ගනුදෙනුකරුවන්ගෙන් මිලදී ගත් දේශීය හා විදේශීය චෙක්පත් මූල්‍ය නොවන වත්කම් ලෙස බැංකුව සැලකිල්ලට ගෙන තිබුණි. කෙසේ වුවද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 ට ( මූල්‍ය උපකරණ - හඳුනා ගැනීම හා මිණීම ) අනුව, මූල්‍ය උපකරණ විශ්ලේෂණය යටතේ මිණීමේ පදනම මත ඒවා මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම්වල ණය සහ ලැබිය යුතු ලෙස සැලකිය යුතුය.

**2.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම්කරණ ප්‍රතිපත්තිවල දක්වා ඇති පරිදි, සින්නක්කර හා බදු දේපල සෑම වර්ෂ 7 කදී සමස්ත පදනමකින් ප්‍රත්‍යාගණනය කළ යුතුය. කෙසේ වුවද කඹුරුපිටිය හා වීරකැටිය ශාඛාවල දේපල බැංකුව විසින් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ආ) ඉඩම් හා ගොඩනැඟිලි හැර 2013 දෙසැම්බර් 31 දිනට රු.බිලියන 4.5 ක් හා රු.බිලියන 1.38 ක් වූ බැංකුව විසින් භාවිතා කරමින් තිබූ පිළිවෙළින් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ස්ථාවර වත්කම් හා සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කරන ලද අස්පෘශ්‍ය වත්කම්, ගිණුම්කරණ ප්‍රතිපත්තිවල දක්වා ඇති පරිදි ඒවායේ ඇස්තමේන්තු ගත ඵලදායී ජීව කාලය සැලකීමෙන් තොරව බැංකුව විසින් පවත්වා ගෙන ගොස් තිබුණි.

**2.3.3 ගිණුම්කරණ අඩුපාඩු**

---

ඉතාලි සමාගමක් විසින් යුරෝ 691,893 ක් (දළ වශයෙන් රු මිලියන 125 ක්) ලංකා බැංකු යුරෝ නොස්ට්‍රෝ (BOC EUR Nostro) ගිණුම මඟින් ගෙවා තිබුණි. අනුරූප බැංකුවට දී තිබූ උපදෙස් වංචනික බව හා බැංකුව අරමුදල් මාරු කිරීම් සඳහා දී තිබූ උපදෙස් වලට අනුකූල නොවන බව පසුව සොයා ගැනුණි.

ඉහත මත භේදය හේතුවෙන් අනුරූප බැංකුවේ බැංකු ප්‍රකාශනය රු මිලියන 86 ක අහිතකර ශේෂයක් පෙන්නුම් කර තිබුණු අතර බැංකුව රු මිලියන 39 ක හිතකර ශේෂයක් 2013 දෙසැම්බර් 31 දිනට පෙන්වා තිබුණි.

**2.3.4 නොසැසඳූ හා හඳුනා නොගත් වෙනස්කම්**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලෙජර් ශේෂයන් සහ පද්ධතියෙන් ජනනය වන විස්තරාත්මක විමසුම් වාර්තා අතර පහත දැක්වෙන නොසැසඳුනු වෙනස්කම් නිරීක්ෂණය විය.

| විස්තරය | ලැබිය යුතු පොලී රු. | අවිනිශ්චිත පොලී රු. | එකතුව රු. |
|---|---|---|---|
| **ණය** | | | |
| ------- | | | |
| ලෙජරය අනුව | 2,990,097,087 | 5,471,763,145 | 8,461,860,232 |
| විමසුම් වාර්තාව අනුව ශේෂය | 2,789,685,870 | 5,427,093,061 | 8,216,778,931 |
| වෙනස | 200,411,217 | 44,670,084 | 245,081,301 |
| **බැංකු අයිරා** | | | |
| -------------- | | | |
| ලෙජරය අනුව ලැබිය යුතු පොලී | - | 2,986,011,773 | 2,986,011,773 |
| විමසුම් වාර්තාව අනුව ලැබිය යුතු පොලී | - | 2,897,296,204 | 2,897,296,204 |
| වෙනස | - | 88,715,569 | 88,715,569 |
| මුළු වෙනස | 200,411,217 | 133,385,653 | 333,796,870 |

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රජය සමග සිදු කරන ලද සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හා ශ්‍රී ලංකා මහ බැංකු (ශ්‍රීලංමබැ) වාර්තාවල දැක්වෙන අදාළ ශේෂයන් අතර පහත වෙනස්කම් නිරීක්ෂණය විය.

| ගනුදෙනු වර්ගය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.000 | ශ්‍රීලංමබැ වාර්තා අනුව ශේෂය රු.000 | වෙනස රු.000 |
|---|---|---|---|
| ණය සහ අත්තිකාරම් | 290,790,922 | 279,405,917 | 11,385,005 |
| තැන්පතු | 113,565,125 | 112,665,130 | 899,995 |

(ඇ) ශ්‍රී ලංකා මහා බැංකු නියාමන අවශ්‍යතා මත පදනම්ව හඳුනාගන්නා ලද රු බිලියන 12.4 ක් වූ අත්හිටුවන ලද පොලී ආදායම සඳහා බැංකුව විසින් හානිකරණ ප්‍රතිපාදනයක් සලසා තිබුණි. කෙසේ වුවද විමසුම් වාර්තාව මත පදනම්ව බැංකුව විසින් ණය, බැංකු අයිරා හා මාලේ ශාඛාවේ ණය වලින් කොටසකට අදාළව රු බිලියන 8.5 ක් වූ අවිනිශ්චිත පොලී බැංකුව විසින් හඳුනාගෙන තිබුණි. රු බිලියන 3.9 ක් වූ වෙනස බැංකුව විසින් විස්තරාත්මකව හඳුනා ගෙන නොතිබුණි.

(ඈ) ඇමරිකාවේ ඩොයිෂ් බැංකුවට සහ ලන්ඩන් ලංකා බැංකුවට (යුරෝ ගිණුම) ශ්‍රී ලංකා මහා බැංකුව මගින් පිළිවෙලින් එජඩො 800,000 ක් හා යුරෝ 200,000 ක් ගිණුම් දෙකකින් මාරු කිරීම සඳහා 2012 ජනවාරි 26 දින බැංකුව විසින් ඉරානයේ බැංකුවකට උපදෙස් දී තිබුණි. 2012 පෙබරවාරි මාසයේදී ඉරාන බැංකුව විසින් එවන ලද ලෝක ව්‍යාප්ත අන්තර් බැංකු මූල්‍ය සන්නිවේදන සංගමයේ (ස්විෆ්ට්) ප්‍රකාශනයට අනුව, ඉල්ලුම් කළ අරමුදල් මාරු කළ බව දැක්වුණි. කෙසේ වුවද, ඩොයිෂ් බැංකු ගිණුමට හා ලන්ඩන් ලංකා බැංකු ගිණුමට කිසිදු මුදලක් ලැබී නොතිබුණි.

එබැවින්, ඉහත අරමුදල් මාරුකිරීම් දෙක 2012 පෙබරවාරි සිට අදාළ බැංකු ගිණුම්වල නොසැසඳුණු විෂයයන් ලෙස දක්වා තිබුණු අතර 2013 දෙසැම්බර් 31 දිනට මුළු නොසැසඳුණු ශේෂය රු. 140,866,880 ක් විය.

**2.3.5 අවිනිශ්චිත ගිණුම් හා දිගුකාලීන හිඟ ශේෂ**

-----------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට පකිස්ථානු බැංකු ගිණුමක දිගුකාලීන මුදල් ශේෂයක් ඇතුළත් රු. 36,495,549 ක් වූ මුදල් හා බැංකු ශේෂයක් පැවතුණ අතර එම ශේෂය තහවුරු කර ගැනීමට අදාළ ලිපි ලේඛන කිසිවක් නොතිබුණි.

(ආ) ආනයන බිල්පත්‍ර, ණයවර ලිපි, නාවික ඇප කර සහ ණයවර ලිපි නාවික ඇප කර නිකුත් කිරීමේදී රැස්කර ගන්නා ලද ගාස්තු ආදායම වෙනත් ණයහිමියන් යටතේ ගිණුම් ගත කළ යුතු අතර උපරිම සති දෙකක කාලයක් ඇතුළත එම ශේෂ බැංකුවේ ආදායම ලෙස හඳුනා ගත යුතුය.

කෙසේ වුවද පහත දැක්වෙන ශේෂ මාස 1 කට වැඩි කාලයක් ගිණුමේ පැවති අතර, අදාළ ගිණුම්වලට මාරු කර නොතිබුණි. එබැවින් බැංකුවේ ආදායම රු මිලියන 493 කින් අඩුවෙන් දක්වා තිබුණි. එහි කාල විශ්ලේෂණය පහත පරිදි වේ.

| | **දින 30 ට අඩු කාලයක් හිඟ හිටි ශේෂය රු.** | **දින 30 සිට දින 90 දක්වා කාලයක් හිඟ හිටි ශේෂය රු.** | **එකතුව රු.** |
|---|---|---|---|
| ශේෂය | 400,748,505 | 38,301,379 | 439,049,884 |

**2.3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

---------------------------------------------------

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 2008 අංක 03 දරන ශ්‍රී ලංකා මහ බැංකු නියෝගයේ 4 (5) වගන්තිය. | තනි ණයකරුවන්ට ලබා දී තිබූ බොහෝ අක්‍රීය ණය පහසුකම් සියයට 30 නොඉක්මවිය යුතු වුවද, එයට අනුකූල වී නොතිබුණි. |
| (ආ) 2010 ජනවාරි 15 දිනැති අංක 46/ 2010 දරන කාර්යාල චක්‍රලේඛය. (කාර්යාල උපදෙස් පිළිබඳ දෙවැනි අතිරේකය) | 'රන් සුරකුම් ණය සේවා ' සඳහා තනි ගනුදෙනුකරුවකුගේ සහ රන් හා ආභරණ ව්‍යාපාරයක යෙදී සිටින ගනුදෙනුකරුවකුගේ 'රන් සුරකුම් ණය සේවා ' උපරිම අනාවරණ සීමාව පිළිවෙලින් රු මිලියන 5 ක් හා රු මිලියන 10 ක් විය යුතු නමුත් චක්‍රලේඛයේ නියම කර ඇති සීමා සැලකීමෙන් තොරව බැංකුව විසින් උකස් අත්තිකාරම් ලබා දී තිබුණි. |

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, බැංකුව සහ එහි පරිපාලිතයන් හා ආශ්‍රිතයන් (සමූහය) සමාලෝචිත වර්ෂයේ රු බිලියන 16.1 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වාර්තා කර තිබූ අතර ඊට අනුරූපීව 2012 වර්ෂයේ බදු පූර්ව ලාභය රු බිලියන 20.2 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී එය රු බිලියන 4.1 ක හෙවත් සියයට 20 ක අඩුවීමක් විය. එසේම බැංකුව රු බිලියන 15.7 ක බදු පූර්ව ලාභයක් වාර්තා කර තිබූ අතර ඊට අනුරූපීව 2012 වර්ෂයේදී එය රු බිලියන 19.8 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 21 ක අඩුවීමක් විය. අඩු ණය වර්ධනයක් හේතුවෙන් බැංකුව සමාලෝචිත වර්ෂයේදී අතිරික්ත ද්‍රවශීලතා තත්ත්වයක් අත් විඳි අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අතිරික්ත අරමුදල් ආයෝජන සුරැකුම්පත්වල ආයෝජනය කර ඇත.

කෙසේ වුවද 2013 වර්ෂය තුළදී අඩු පොලී පාලනය පැවතීම හේතුවෙන් ආයෝජන කළඹෙන් පොලී ආදායම රු බිලියන 23 සිට රු බිලියන 27 දක්වා පමණක් වැඩි වී තිබුණි.

දළ ණය හා අත්තිකාරම් රු බිලියන 755 ක් ලෙස පැවති අතර 2012 වර්ෂය සමඟ සැසඳීමේදී එය රු බිලියන 714 ක් වූයෙන් සියයට 6 ක වර්ධනයක් විය. රජයට සහ රජය සතු ව්‍යාපාර සඳහා ණය දීම රු බිලියන 290 දක්වා වර්ධනය වී තිබූ අතර එය 2012 වර්ෂයේදී රු බිලියන 274 ක් විය.

(ආ) අක්‍රිය උකස් අත්තිකාරම් වැඩිවීම හේතුවෙන් 2013 වර්ෂය තුළදී අක්‍රිය ණය කළඹ වැඩි වී තිබුණි. 2013 වර්ෂයේ සිට රන් මිල පහත වැටී මෙන් එම අංශය හරහා උකස් ණය කළඹට බලපෑමක් වී තිබූ අතර 2013 වර්ෂයේදී රු මිලියන 2,033 ක ඉහළ හානිකරණ ගාස්තුවක් අවශෝෂණය කර ගැනීමට බැංකුවට අවශ්‍ය කෙරුණි.

වර්ෂය තුළදී බැංකුවේ මෙහෙයුම් වියදම් රු බිලියන 23 ක් වූ අතර 2012 වර්ෂයේදී එය රු බිලියන 20 ක් වූ හෙයින් සියයට 15 කින් වැඩිවී තිබුණි. කාර්ය මණ්ඩල වියදම් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 14 කින් වැඩි වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ විවිධ අදියරයන්හි මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත වගුවෙහි දැක්වේ.

| | **බැංකුව** | | **සමූහය** | |
|---|---|---|---|---|
| | **2013** | **2012** | **2013** | **2012** |
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| පොලී ආදායම | 114,863 | 95,022 | 119,504 | 98,751 |
| පොලී වියදම | (77,720) | (59,701) | (80,162) | (61,489) |
| **ශුද්ධ පොලී ආදායම** | **37,143** | **35,321** | **39,342** | **37,262** |
| **ශුද්ධ ගාස්තු හා කොමිෂන් ආදායම** | **5,737** | **6,666** | **5,935** | **6,770** |

| | | | | |
|---|---|---|---|---|
| වෙළඳාමෙන් ශුද්ධ ලාභය/ (පාඩුව) | 3,233 | 3,773 | 3,268 | 3,754 |
| මූල්‍ය ආයෝජනයෙන් ශුද්ධ ලාභය/ (පාඩුව) | 425 | 367 | 470 | 368 |
| වෙනත් මෙහෙයුම් ආදායම | 2,486 | 3,656 | 4,197 | 5,123 |
| **මුළු මෙහෙයුම් ආදායම** | **49,024** | **49,783** | **53,212** | **53,277** |
| ණය සහ වෙනත් පාඩු සඳහා හානිකරණය (ගාස්තු) /පිළිවැරීම | (6,923) | (5,904) | (7,339) | (6,006) |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | **42,101** | **43,879** | **45,873** | **47,271** |
| **මුළු මෙහෙයුම් වියදම** | **(23,681)** | **(20,870)** | **(27,241)** | **(23,789)** |
| **එකතු කළ අගය මත බදුවලට (VAT) පෙර මෙහෙයුම් ලාභය** | **18,420** | **23,009** | **18,632** | **23,482** |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු (VAT) | (2,711) | (3,214) | (2,756) | (3,275) |
| එකතු කළ අගය මත බදුවලින් (VAT) පසු මෙහෙයුම් ලාභය | 15,709 | 19,795 | 15,876 | 20,208 |
| ආශ්‍රිත සමාගම්වල බදුවලට පෙර ලාභ/ (පාඩු) කොටස | - | - | 228 | 39 |
| **ආදායම් බදුවලට පෙර ලාභය** | **15,709** | **19,795** | **16,104** | **20,246** |
| ආදායම් බදු වියදම | (3,622) | (5,378) | (3,956) | (5,638) |
| **වර්ෂය සඳහා ලාභය** | **12,087** | **14,417** | **12,148** | **14,608** |

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

--------------------------------------

**වැදගත් අනුපාත**

---------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 සඳහා වූ වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | **ශ්‍රී ලං ම බැ ප්‍රතිමාන** | **2013** % | **2012** % | **තථ්‍ය 2011** % | **2010** % | **2009** % |
|---|---|---|---|---|---|---|
| (අ) ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය (පෙළ 1) | 5.00 | 8.4 | 8.3 | 7.8 | 10.3 | 11.2 |
| (ආ)ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය (පෙළ 2) | 10.00 | 12.1 | 11.5 | 10.9 | 13.7 | 14.2 |
| (ඇ) ආදායම් වර්ධන | - | 15.7 | 56.3 | 11.2 | (0.2) | 5.5 |
| (ඈ) වත්කම් මත ප්‍රතිලාභ | - | 1.4 | 2.1 | 2.1 | 1.6 | 0.8 |
| (ඉ) ද්‍රවශීලතා අනුපාතය | 20.00 | 27.7 | 21.8 | 23.4 | 28.7 | 21.1 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවේ ආදායම් වර්ධන අනුපාතය සියයට 56.3 සිට සියයට 15.7 දක්වා අඩු වී තිබූ අතර ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී එය සැලකිය යුතු අඩුවීමක් විය.

(ආ) බැංකුවේ ද්‍රවශීලතා අනුපාතය 2011 වර්ෂයේ සියයට 23.4 සමඟ සැසඳීමේදී 2012 වර්ෂයේ සියයට 21.8 දක්වා අඩු වී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී සියයට 27.7 දක්වා වැඩි වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**4.1 ණය පරිපාලනය**

---------------------

(අ) උකසට තබන ලද සුරැකුම් පිළිබඳ විධිමත් ඇගයීමකින් තොරව හා ගනුදෙනුකරුවන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව ඇගයීමෙන් තොරව ඇතැම් ණය හා අත්තිකාරම් ලබා දී තිබූ බව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය. ගනුදෙනුකරුවන්ගේ විගණිත ගිණුම් හා සමාගම් පිහිටුවීමට අදාළ නෛතික ලියකියවිලි කාලීන පදනමින් ලබා ගෙන නොතිබුණි. තවද අත්තිකාරම් සඳහා අදාළ ලිපි ලේඛන ගොනු, අදාළ ලියකියවිලි හා තොරතුරු සමඟ යාවත්කාලීන කර නොතිබුණි. සමහර අවස්ථාවලදී උකසට තබන ලද දේපලවලට අදාළව රක්ෂණ සහතික ලබාගෙන / නිසි පරිදි අළුත්කිරීම් කර නොතිබුණි. උකසට තබන දේපල පිළිබඳ ක්‍රමානුකූල පරීක්ෂණයන් සිදු කර නොතිබුණි. ඇතැම් අවස්ථාවලදී අදාළ ණයකරුවන්ගෙන් නිරවුල් කිරීමේ ලිපි ලබා ගෙන නොතිබුණි.

උදා:- රත්මලාන, මීරිගම, වේයන්ගොඩ, මීගමුව නගරය, යක්කල, බියගම හා හංවැල්ල ශාඛා.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පහත දැක්වෙන ශාඛාවල අක්‍රීය අත්තිකාරම්ද (NPA) සමාලෝචිත වර්ෂය සඳහා ඉහළ ප්‍රතිශතයන් නිරූපණය කර තිබුණි.

| ශාඛාවේ නම | මුළු අත්තිකාරම<br>රු. | මුළු අක්‍රීය අත්තිකාරම<br>රු. | අක්‍රීය අත්තිකාරම් මුළු අත්තිකාරම්වල ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| දෙවැනි ආයතනික | 2,474,771,941 | 2,340,238,141 | 94.56 |
| අච්චුවේලි | 1,250,535,407 | 555,454,759 | 44.41 |
| කිලිනොච්චි | 1,043,364,870 | 350,815,153 | 33.62 |
| පානදුර | 2,165,529,408 | 491,733,335 | 22.70 |
| නුගේගොඩ | 3,063,410,537 | 450,275,576 | 14.69 |
| මෙට්‍රොපොලිටන් | 7,670,314,822 | 817,350,823 | 10.65 |

(ii) 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ගනුදෙනුකරුවන් දස දෙනෙකුගේ අක්‍රීය අත්තිකාරම් එකතුව රු. 2,877,663,707 ක් විය.

(iii) පිළිවෙලින් රු. 86,541,248 ක් හා රු. 108,193,439 ක් වූ හිඟ ණය හා අත්තිකාරම්වලට අදාළ මුල් මුදල හා පොලිය සමාලෝචිත වර්ෂය තුළදී ලියා හැර තිබුණි.

(iv) රජය සතු ව්‍යවසාය හයකට ලබාදුන් ණය දීර්ඝ කාලයක් අක්‍රීය අත්තිකාරම් අංශයේ පැවතුණි. 2013 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ මුදල රු මිලියන 697.34 ක් විය. විස්තර පහත පරිදි වේ.

| සමාගම | හිඟ ප්‍රාග්ධන මුදල රු මිලියන | ලැබිය යුතු පොලී රු මිලියන | මුළු හිඟය රු මිලියන |
|---|---|---|---|
| සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | 32.30 | 72.22 | 104.52 |
| සීමාසහිත ජනතා ෆර්ටිලයිසර් එන්ටප්‍රයිසස් සමාගම | 51.72 | 234.92 | 286.64 |
| සීමාසහිත බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් ලංකා සමාගම | 101.34 | 189.24 | 290.58 |
| සමූපකාර තොග වෙළඳ සංස්ථාව | •1.00 | - | 1.00 |
| සීමාසහිත ලංකා සළුසල | • •1.00 | - | 1.00 |
| ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව | 8.73 | 6.87 | 15.60 |
| එකතුව | 194.09 | 503.25 | 697.34 |

- • සමූපකාර තොග වෙළඳ සංස්ථාව - ලියා හරින ලද මුදල රු මිලියන 100 කි.
- • • සීමාසහිත ලංකා සළුසල - ලියා හරින ලද මුදල රු මිලියන 35 කි.

**(ආ) ණයපත්**

---------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 දෙසැම්බර් 31 දිනට කාඩ් මධ්‍යස්ථානය විසින් ණයපත් 66,496 ක් නිකුත් කර තිබූ අතර එදිනට මුළු හිඟ ශේෂය රු. 2,448,982,476 ක් විය. මෙයින් රු. 178,984,306 ක් හෙවත් සියයට 7.3 ක් අක්‍රීය ලෙස වර්ගීකරණය කර තිබුණි. මුළු අක්‍රීය අත්තිකාරම්වල විස්තර පහත පරිදි වේ.

| වර්ගය | මුදල රු. |
|---|---|
| කල් ඉක්මුණු | 10,801,643 |
| උප ප්‍රාමාණික (Substandard) | 24,134,813 |
| සැක සහිත | 19,956,451 |
| පාඩු | 124,091,399 |
| එකතුව | 178,984,306 |

(ii) කාඩ් ලබා ගත් දින සිට 2013 දෙසැම්බර් 31 දක්වා එක් වාරිකයක් හෝ ගෙවා නොමැති කාඩ් හිමිකරුවන් සංඛ්‍යාව 95 ක් වූ අතර මුළු හිඟ මුදල රු. 3,126,588 ක් විය.

(iii) සමාලෝචිත වර්ෂය තුළදී ලියා හරින ලද මුල් මුදල හා පොලිය පිළිවෙළින් රු. 3,644,559 ක් රු. 4,550,322 ක් විය.

**(ඇ) කල් බදු**

----------

කල් බදු ව්‍යාපාර සම්බන්ධයෙන් පහත දැක්වෙන ශාඛා ඉතා ඉහළ අක්‍රීය ණය අත්තිකාරම් වාර්තා කර තිබුණි.

| **ශාඛාවේ නම** | **2013 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ශේෂය**<br>**රු.** | **2013 දෙසැම්බර් 31 දිනට මුළු කල්බදු අක්‍රීය ණය අත්තිකාරම්**<br>**රු.** | **අක්‍රීය අත්තිකාරම් මුළු හිඟයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|
| යුනියන් පෙදෙස අධි ශ්‍රේණි | 439,821,377 | 295,491,729 | 67 |
| දෙහිවල අධි ශ්‍රේණි | 116,447,301 | 70,307,397 | 60 |
| මාලබේ | 161,494,821 | 63,828,544 | 40 |
| බණ්ඩාරගම | 66,967,685 | 22,464,915 | 34 |
| අතුරුගිරිය | 78,459,871 | 20,413,774 | 26 |
| කඩුවෙල | 192,244,448 | 41,254,353 | 21 |
| පානදුර අධි ශ්‍රේණි | 118,674,381 | 21,230,420 | 18 |
| මීරිගම | 106,809,518 | 18,197,677 | 17 |
| කෑගල්ල අධි ශ්‍රේණි | 154,277,997 | 17,598,033 | 11 |
| මෙට්‍රොපොලිටන් | 1,694,850,911 | 114,685,171 | 07 |

**(ඈ) ලංකා ඛනිජතෙල් සංස්ථාවට ණය ලබාදීම**

----------------------------------------------

බැංකුව ලංකා ඛනිජතෙල් සංස්ථාවට (CPC) ආනයන පහසුකම් කිහිපයක් ලබා දී තිබූ අතර 2013 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ශේෂය රු බිලියන 228.8 ක් විය. බැංකුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට ලබා දී තිබුණු ආනයන පහසුකම්වල මුළු හිඟ ශේෂයෙන් 61 ක් මෙයින් නියෝජනය වන බව නිරීක්ෂණය විය.

2013 දෙසැම්බර් 31 දිනට ණය අනාවරණය පහත පරිදි වේ.

| පහසුකම් වර්ගය | 2013 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජතෙල් සංස්ථාවෙන් හිඟ ශේෂය<br>රු. | 2013 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු හිඟ ශේෂය<br>රු. | මුළු හිඟ ශේෂයේ ප්‍රතිශතය |
|---|---|---|---|
| ණයවර ලිපිය | 48,151,133,777 | 79,915,578,230 | 60 |
| ප්‍රතිග්‍රහණය | 66,285,721,777 | 91,832,810,086 | 72 |
| විදේශ මුදල් ණය | 114,348,135,600 | 205,600,247,169 | 56 |

| | | | |
|---|---|---|---|
| එකතුව | 228,784,991,154 | 377,348,635,485 | 61 |

**(ඉ) හානිකරණය ගණනය කිරීම**

---

(i) පහත දැක්වෙන ණය කළඹයන්හි ණය පාඩු ප්‍රතිපාදනය ගණනය කිරීමේදී, බැංකුව විසින් 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නියාමන ණය පාඩු ප්‍රතිපාදනය භාවිතා කර තිබුණි.

| **ණය වර්ගය** | **2013 දෙසැම්බර් 31 දිනට ණය මුදල්වල ක්‍රමක්ෂය පිරිවැය රු.** |
|---|---|
| නව විස්තීර්ණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS) | 541,658,863 |
| පෙරවරණය කළ දේපල | 839,056,170 |
| ඉස්ලාමීය බැංකුකරණය | 124,228,306 |
| පරිගණකගත නොකරන ලද | 125,993,000 |

(ii) නියාමන ණය පාඩු ප්‍රතිපාදනය හානිකරණ ප්‍රතිපාදනය ලෙස සලකා තිබුණු අතර මාලේ ශාඛාව විසින් 2013 වර්ෂයේ මූල්‍ය වාර්තාකරණයේදී පහත සඳහන් කළඹයන්හි සංගත හානිකරණ ක්‍රමවේදයක් යොදා ගෙන නොතිබුණි.

2013 දෙසැම්බර් 31 දිනට අදාළ කළඹ ශේෂයන් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| හුවමාරු බිල්පත් | - | රු. 68,165,476 |
| වෙළඳ මූල්‍ය | - | රු. 793,437,202 |
| කාර්ය මණ්ඩල ණය | - | රු. 7,751,384 |

**(ඊ) රජය සතු පාඩු ලබන ව්‍යවසායන්හි හානිකරණ තක්සේරුවේදී සලකා බලන ලද ඇස්තමේන්තු වලංගු කිරීමේ අවශ්‍යතාවය හා උපකල්පනයන්.**

---

2013 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු ණය අනාවරණයෙන් දළ වශයෙන් සියයට 38 ක් ශ්‍රී ලංකා රජයට හා රජය සතු ආයතනවලට (SOEs) ණය දීමෙන් සමන්විත වේ. හානිකරණ තක්සේරුවේදී හානිකරණ කොන්දේසි පවතින සමහර සැලකිය යුතු රජය සතු ආයතන (SOEs) රජයට අනුබද්ධ පදනම මත හානිකරණ කොන්දේසි බලනොපාන ආයතන ලෙස බැංකුව විසින් සලකා තිබුණි. කෙසේ වුවද මෙම ණය, භාණ්ඩාගාර ඇපකර හෝ වෙනත් එවැනි වෙනත් සුරැකුම් මඟින් මුළුමනින්ම සමායනය කර තිබූ බව නිරීක්ෂණය විය.

**(උ) ණය අනුපාතයන් තක්සේරු කිරීමේ අවශ්‍යතාවය - වෙළඳ මූල්‍ය ණය**

---

මෙම ණය පරිගණකගත නොකරන ලද ණය (Manual Loans) ලෙස හැඳින්වීම හේතුවෙන් ශාඛා මඟින් ලබා දී තිබූ දළ වශයෙන් රු මිලියන 970 ක වෙළඳ මූල්‍ය ණය ඒකාබද්ධ විස්තීර්ණ බැංකු පද්ධතියේ (ICBS) නිරූපණය වී නොතිබුණි. එබැවින් මෙම ණය සඳහා කාල විශ්ලේෂණයක් නොතිබුණි.

ඉහත කරුණට අමතරව, ශුද්ධ ප්‍රවාහ අනුපාතිකය (Net Flow Rates) ගණනය කිරීමට වෙළඳ මූල්‍ය ණය පිළිබඳ කාල විශ්ලේෂණයක් නිරූපණය කිරීම සඳහා වෙළඳ මූල්‍ය කළඹ

පවත්වා ගෙන යන "බැංකු වෙළඳ පද්ධතිය" (Bank Trade System)ට පහසුකම් සපයා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඒකාබද්ධ විස්තීර්ණ බැංකු පද්ධතියේ පවත්වා ගෙන යන හානිකරණය නොවූ ගනුදෙනුකරුවන්ගේ සැලකියයුතු තනි පුද්ගල ණය (Individual Significant Loans) සඳහා යෝග්‍ය ශුද්ධ ප්‍රවාහ අනුපාතිකයේ (NFR) සාමාන්‍යය මත වෙළඳ මූල්‍ය කළඹෙහි ශුද්ධ අනුපාත ප්‍රවාහය පදනම්ව ගණනය කර තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ මධ්‍යම මුදල් ඒකකය සඳහා රක්ෂණ ආවරණය ප්‍රමාණවත් නොවීම.**

----------------------------------------------------------------------------------------------

මධ්‍යම මුදල් ඒකකයේ අතැති මුදල් පිළිබඳ රක්ෂණ ආවරණය රු බිලියන 1 ක් වූ අතර, 2013 දෙසැම්බර් 31 දිනට තථ්‍ය අතැති මුදල් ශේෂය රු බිලියන 2.7 ක් විය. එබැවින් මධ්‍යම මුදල් ඒකකයේ අතැති මුදල් සඳහා රක්ෂණ ආවරණය ප්‍රමාණවත් නොවීය.

**(ආ) සීමාසහිත ලංකා බැංකුවේ කරන ලද (එක්සත් රාජධානිය) ආයෝජනය පිළිබඳ පාඩු හානිකරණය තක්සේරු කිරීමේ අවශ්‍යතාවය.**

---------------------------------------------------------------------------------------------

සීමාසහිත ලංකා බැංකුව (එක්සත් රාජධානිය) යනු බැංකුවේ සම්පූර්ණ අයිතිය සතු පරිපාලිතයකි. 2013 දෙසැම්බර් 31 දිනට ආයෝජනවල ධාරණ අගය රු. 2,683,859,000 ක් වූ අතර ආයෝජනයේ පිරිවැයට වඩා අඩු සාධාරණ අගයකට යාමේ ප්‍රවනතාවක් පහත දැක්වෙන දර්ශකයන් මඟින් පෙන්නුම් කෙරේ. සමාගමේ ලාභදායීත්වය අඛණ්ඩව පිරිහෙමින් තිබෙන බවද නිරීක්ෂණය විය.

| කාලය | මෙහෙයුම් ආදායම | බදුවලට පසු ශුද්ධ ලාභය / (පාඩුව) |
|---|---|---|
| | මහා බ්‍රිතාන්‍ය පවුම් | මහා බ්‍රිතාන්‍ය පවුම් |
| 2010 දෙසැම්බර් 31 දිනෙන් මාස 8 ක කාලපරිච්ඡේදය | 1,813,000 | 14,000 |
| 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | 1,443,000 | (439,000) |
| 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | 1,672,000 | (221,000) |
| 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | 1,528,000 | (422,000) |

පාඩු වැඩිවීම හේතුවෙන්, එහි ආරම්භක වර්ෂය වූ 2010 සිටම ලාභාංශ ගෙවීමට නොහැකි වූ තත්ත්වයක සමාගම පැවතුණි.

**(ඇ) ගනුදෙනු මැදිරියේ (Dealing Room) හඬ පටිගත කිරීම් පද්ධතිය.**

--------------------------------------------------------------------------------

ප්‍රධාන කාර්යාල වෙළඳ නියෝජිත දුරකථන (dealer phones) යන්ට හඬ පටිගත කිරීමේ ක්‍රමයක් බැංකුව ස්ථාපිත කර තිබූ නමුත් ගැටලුවක් මත පැමිණිල්ලක් කිරීම හේතුවෙන් පමණක් එයට සවන් දිය හැකි විය.

බලපත්‍රලාභී වාණිජ බැංකුවල විදේශ විනිමය ව්‍යාපාර සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණය පිළිබඳ 2009 අංක 3 දරන ශ්‍රී ලංකා මහ බැංකු නියෝගයේ අංක 4.1 (xiv) කරුණින් අවශ්‍ය පරිදි මධ්‍යම කාර්යාල / අවදානම් කළමනාකරණ ඒකකයේ පත් කරන ලද ස්වාධීන නිලධාරියකු මඟින් මෙම පටිගත කළ ඇමතුම් නිරන්තර පදනමක් මත සවන් දීම හෝ අධීක්ෂණය කිරීම කළ යුතුය. කෙසේ වුවද බැංකුව මෙම නියෝගයට අනුකූල වී නොතිබුණි.

**(ඈ) කල්බදු ඉඩම සඳහා බදු ගිවිසුම් නොමැති වීම.**

--------------------------------------------------------

කල්බදු ඉඩම් 62 ක් සඳහා බැංකුව විසින් නීත්‍යානුකූලව බැඳුණු කල්බදු ගිවිසුම් අත්පත් කර ගෙන නොතිබුණි. අවස්ථා කිහිපයකදී, අදාළ බලධාරීන් විසින් නිකුත් කරන ලද ලිපි වැනි රාජකාරි ලියකියවිලි තිබුණු අතර ඇතැම් අවස්ථාවලදී කල්බදු දේපල භාවිතා කිරීම සඳහා අයිතිය තහවුරු කර ගැනීමට කිසිදු සාක්ෂියක් බැංකුවට නොතිබුණි. එසේම සින්නක්කර ඉඩම් දේපල 03 ක් සඳහා නීත්‍යානුකූල ඉඩම් ඔප්පු බැංකුව අයත් කර ගෙන නොතිබුණි.

**(ඉ) කල්බදු ව්‍යාපාරවල යෙදවුම් බදු හිමිකම් ඉල්ලීමේ ප්‍රමාදය.**

------------------------------------------------------------------------

එකතු කළ අගය මත බදු පනතේ 22 (6) වගන්තිය ප්‍රකාරව, යෙදවුම් බදු බැරකම එම බදු ඉන්වොයිසියේ දිනයෙන් මාස 12 ක් ඉකුත් වන දින හෝ ඊට පෙර හිමිකම් ඉල්ලා සිටිය යුතුය. කෙසේ වුවද කල්බදු ව්‍යාපාරවලට අදාළව බදු ඉන්වොයිසි මුල් පිටපත් හිමිකම් ඉල්ලීම සඳහා ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීම ශාඛා කිහිපයක් විසින් ප්‍රමාද කර තිබුණි. එබැවින්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අයකර ගත නොහැකි කල් ඉකුත් වූ යෙදවුම් බදු ඇතුළත් ලෙජර ශේෂය රු. 3,980,860 ක් විය.

**4.3 බරපතල වංචා**

-------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) බලය නොලත් අරමුදල් මාරුකිරීම්**

------------------------------------------

**මෙට්‍රොපොලිටන් ශාඛාව**

-----------------------------

(i) වංචනිකයෙකු විසින් කරන ලද වංචා සහගත ඉල්ලීමක් මත මිය ගිය ගනුදෙනුකරුවකුගේ මෙට්‍රොපොලිටන් ශාඛාවේ පැවති අනේවාසික විදේශ මුදල්

ගිණුමකින් (NRFC Account) රු මිලියන 5.8 ක මුදලක් 2013 ඔක්තෝබර් 23 දින දේශීය පුද්ගලික බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමකට මාරු කර තිබුණි.
මූලික විමර්ශනයේ සොයා ගැනීම් අනුව, ඉහත සඳහන් මුදල් මාරු කිරීමේදී "අත්සන වෙනස්" සටහන පිළිබඳ ඉල්ලීමක් තිබියදීත් ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුට යොමු කිරීමෙන් තොරව කළමනාකරු හා සහකාර කළමනාකරු විසින් සම්පූර්ණයෙන්ම නොසැලකිලිමත් ආකාරයෙන් ඔවුන්ගේ රාජකාරීන් සිදු කර ඇති බව අනාවරණය විය.

වැඩිදුර විමර්ශනයන් සිදුකරමින් තිබූ අතර, එම කරුණ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවට වාර්තා කර තිබුණි.

(ii) ගනුදෙනුකරුවකු විසින් එජඩො 784,562 ක් වූ (පොලිය සහිතව) තම ස්ථාවර තැන්පතුව බැංකුව විසින් අනුමැතිය නොමැතිව මාරු කර තිබූ බවට චෝදනාවක් කර තිබුණි. අදාළ ඉල්ලීම් හා වෙනත් ලියකියවිලි ඊමේල් මඟින් යවා තිබුණි. යූඒඊ (UAE) හි බැංකු නියෝජිත නිලධාරියා හා මෙට්‍රොපොලිටන් ශාඛාවේ බැංකු කළමනාකරු විසින් ගනුදෙනුකරු හඳුනා ගැනීම දුරකථනය මඟින් යළි තහවුරු කර ගැනීමට අපොහොසත් වී තිබුණි. කෙසේ වුවද බැංකු කළමනාකරු විසින් ඉහළ අධිකාරියකින් තවදුරටත් උපදෙස් ලබා ගැනීමෙන් තොරව මෙම අරමුදල් මාරු කිරීම සිදු කර තිබුණි. ගනුදෙනුකරු විධිමත්ව හඳුනා ගැනීමෙන් තොරව නොසැලකිලිමත් ආකාරයෙන් බැංකුව විසින් එකී ගනුදෙනුව සිදු කර තිබුණි.

**පුද්ගල ශාඛාව (Personal Branch)**

(i) පුද්ගල ශාඛාවේ ගනුදෙනුකරුවකුගේ නේවාසික විදේශ මුදල් (DFC) ගිණුමෙන් රු මිලියන 11.1 කට සමාන එජඩො 86,384 ක් විමසුම් නොකළ ප්‍රභවයක් මත වංචනිකයකු විසින් කරන ලද වංචනික ඉල්ලීමක් මත සයිප්‍රස් බැංකුවේ ගිණුමකට බැංකුව විසින් මාරු කර තිබුණි. මෙම කරුණ පිළිබඳ විමර්ශනයන් ප්‍රගතියේ පවතී.

(ii) පුද්ගල ශාඛාවේ ගනුදෙනුකරුවකුගේ විශේෂ විදේශ ආයෝජන තැන්පතු (SFIDA) ඉතිරි කිරීමේ ගිණුමෙන් එජඩො 70,000 ක් හා මහා බ්‍රිතාන්‍ය පවුම් 200,000 ක් වූ අරමුදල් ගනුදෙනුකරුවකු විසින් විවිධ ඊ මේල් යොදා ගනිමින් කරන ලද වංචනික ඉල්ලීමක් මත චීන බැංකු ගිණුමකට හා යූඒඊ (UAE) බැංකු ගිණුමකට බැංකුව විසින් මාරු කර තිබුණි. මෙම කරුණ සම්බන්ධ විමර්ශනයන් ප්‍රගතියේ පවතී.

**(ආ) රු මිලියන 8 ක් වටිනා රන් භාණ්ඩ ඉවත් කර ගැනීම - බගවන්තලාව ශාඛාව**

බගවන්තලාව ශාඛාවේ කළමනාකරු ලෙස කටයුතු කළ නිලධාරියකු විසින් සුරක්ෂිතාගාරයේ තැන්පත් කර තිබූ ගනුදෙනුකරුවන් විසින් උකසට තබන ලද රන් භාණ්ඩ වංචනිකව ඉවත් කර ගෙන තිබුණි. ඉවත්කරගෙන තිබූ භාණ්ඩ සඳහා බැංකුව විසින් ගෙවන ලද මුළු අත්තිකාරම් දළ වශයෙන් රු මිලියන 8ක් විය. කළමනාකරු බැංකු සේවයෙන් විශ්‍රාම ලබා සිටියද ඇයගේ විශ්‍රාම ප්‍රතිලාභ බැංකුව විසින් රඳවා ගෙන තිබුණි. මෙම කරුණ

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්තා කර ඇති අතර විමර්ශනයන් ක්‍රියාත්මක වෙමින් පවතී.

**(ඇ) උකස් අත්තිකාරම් වංචනිකව නිර්මාණය කිරීම - බෝපිටිය ශාඛාව**

---

බැංකුවේ කණිෂ්ඨ විධායක නිලධාරියෙකු විසින් පද්ධතියේ උකස් අත්තිකාරම් වංචනිකව නිර්මාණය කර රු මිලියන 18 ක් වංචා කර තිබුණි. වංචාව සොයා ගැනීමෙන් පසු එම නිලධාරියා රටින් පිටව ගොස් තිබුණු අතර බැංකු සේවයෙන් ඔහුගේ සේවය තහනම් කර තිබුණි. සම්පූර්ණයෙන්ම නොසැලකිලිමත් ආකාරයෙන් රාජකාරි සිදු කරන ලද කළමනාකරුට විනය ක්‍රියාමාර්ග අවසන් වනතුරු බැංකු සේවය තහනම් කරන ලදී. මෙම කරුණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට (CID) වාර්තා කර ඇත.

**(ඈ) රු මිලියන 3 ක් වටිනා රන් භාණ්ඩ මාරු කිරීම - මාකඳුර ව්‍යාපෘති කාර්යාලය**

---

මාකඳුර ශාඛාවේ කළමනාකරු ලෙස කටයුතු කළ බැංකු නිලධාරියා විසින් වංචනිකව උකස් කරන ලද රන් භාණ්ඩ වෙනුවට ව්‍යාජ භාණ්ඩ මාරු කර තිබුණි. ඉවත් කර ගන්නා ලද රන් භාණ්ඩවල දළ වටිනාකම දළ වශයෙන් රු මිලියන 3 ක් වූ අතර, නිලධාරියාට බැංකු සේවය තහනම් කරන ලදී. තවදුරටත් විමර්ශනයන් කෙරෙමින් පවතී.

**5. පද්ධති හා පාලන**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සභාපති වෙත වරින් වර නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තා මඟින් බැංකුවේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ණය පරිපාලනය
(ආ) ශාඛා කටයුතු
(ඇ) ඉන්වෙන්ටරි
(ඈ) තැන්පතු
(ඉ) බදු කරණය
(ඊ) ආයෝජන
(උ) ගිණුම් වාර්තා පවත්වාගෙන යාම
(ඌ) තාවකාලික අයිරා පහසුකම්